# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1778/33 — 2012 ඔක්තෝබර් මස 04 වැනි බ්‍රහස්පතින්දා - 2012.10.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

මගේ අංකය: 01/10/03/04.

### ඌව පළාතේ පළාත් සභාව

ඌව පළාත් ආණ්ඩුකාරවරයා විසින් කරන ලද පත්කිරීම්

ඌව පළාත් ආණ්ඩුකාරවර ගරු සී. නන්ද මැතිව් මැතිතුමා විසින් පහත සඳහන් පත්කිරීම් සිදු කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

01. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන පන්තියේ නිලධාරී ඩබ්. රත්දෙණිය මහතා 2012.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි, බණ්ඩාරවෙල මහා නගර සභාවේ නාගරික කොමසාරිස් තනතුරේ වැඩ බැලීමට,

02. ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ විශ්‍රාමික නිලධාරී ආර්. එම්. හේමචන්ද්‍ර බණ්ඩාර මහතා 2012.07.01 වැනි දින සිට ඌව පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ සහකාර ඉඩම් කොමසාරිස් තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු පත් කරන තෙක් හෝ 2013.06.30 වැනි දින හෝ යන දෙකෙන් කලින් එළඹෙන දිනය දක්වා පමණක් එම තනතුරේ කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීමට,

03. ඌව පළාත් අධ්‍යක්ෂ (ගොඩනැගිලි), කේ. ඒ. බී. සෙනෙවිරත්න මහතා 2012.06.23 දින සිට 2012.07.01 දින දක්වා විදේශ ගත වන බැවින්, 2012.06.23 දින සිට ඒ මහතා නැවත දිවයිනට පැමිණෙන තෙක් ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධාරී එච්. එම්. ජයරත්න මහතා 2012.06.23 වැනි දින සිට 2012.07.01 දින දක්වා ක්‍රියාත්මක වන පරිදි, ඌව පළාත් අධ්‍යක්ෂ (ගොඩනැගිලි) තනතුරේ රාජකාරී ආවරණය කිරීමට,

04. ඌව පළාත් සභාවේ අධ්‍යක්ෂ (අයවැය), ආර්. ටී. එස්. එල්. ජයසිංහ මහතා 2012.06.23 වැනි දින සිට 2012.07.03 දින දක්වා විදේශ ගත වන බැවින්, 2012.06.23 දින සිට ඒ මහතා නැවත දිවයිනට පැමිණෙන තෙක්, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරී එච්. ඩී. සී. පී. ජයරත්න මහතා, තම නිත්‍ය තනතුරේ රාජකාරී වලට අතිරේකව ඌව පළාත් සභාවේ අධ්‍යක්ෂ (අයවැය). තනතුරේ රාජකාරී ආවරණය කිරීමට,

05. බදුල්ල නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ ඒ. බී. එම්. විජයතුංග මහතා 2012.06.24 දින සිට 2012.06.30 දින දක්වා විදේශ ගත වන බැවින්, 2012.06.24 දින සිට ඒ මහතා නැවත දිවයිනට පැමිණෙන තෙක්, සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ ටී. එල්. ඩී. ලලිත් නිශේන්ද්‍ර මහතා, තම නිත්‍ය තනතුරේ රාජකාරිවලට අතිරේකව, බදුල්ල නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුරේ රාජකාරී ආවරණය කිරීමට,

06. ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා), එම්. එල්. සී. ප්‍රනාන්දු මහතා 2012.06.23 දින සිට 2012.07.01 දින දක්වා විදේශ ගත වන බැවින්, 2012.06.23 දින සිට ඒ මහතා නැවත දිවයිනට පැමිණෙන තෙක්, පළාත්